# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1998 අංක 31 දරන විජය කුමාරතුංග අනුස්මරණ පදනම පනත

---

[සහතිකය සටහන් කළේ 1998 ජූනි මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 ජූනි මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II-වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 9.00 යි. තැපැල් ගාස්තුව : රු. 2.50 යි.

**1998 අංක 31 දරන විජය කුමාරතුංග අනුස්මරණ පදනම් පනත**

[සහතිකය සටහන් කළේ 1998 ජූනි මස 10 වැනි දින]

එල්.ඩී.—ඕ. 7/97.

**විජය කුමාරතුංග අනුස්මරණ පදනම යනුවෙන් හඳුන්වනු ලබන පදනමක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද , එහි අරමුණු හා බලතල නිශ්චයකොට දැක්වීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික සියලු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1998 අංක 31 දරන විජය කුමාරතුංග අනුස්මරණ පදනම පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. (ලුහුඬු නාමය.)

I වන කොටස

**විජය කුමාරතුංග අනුස්මරණ පදනම පිහිටුවීම**

2. (1) අභාවප්‍රාප්ත විජය කුමාරතුංග මහතා අනුස්මරණය කිරීම අවිච්ඡින්නව පවත්වාගෙන යාම සඳහා, මෙහි මින් මතු මේ පනතෙහි "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන, විජය කුමාරතුංග අනුස්මරණ පදනම යනුවෙන් හැඳින්විය යුතු පදනමක් පිහිටුවනු ලැබේ. (විජය කුමාරතුංග අනුස්මරණ පදනම පිහිටුවීම.)

(2) පදනම, (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් සංස්ථාවක් වන අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇත්තේ ය, තවද එම නාමයෙන් එය විසින් ද, එයට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැක්කේ ය.

3. (1) මේ පනතෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන, පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් විසින් පදනම පරිපාලනය කරනු ලැබිය යුතු ය:— (පදනමේ කළමනාකාර මණ්ඩලයේ සාමාජිකයෝ.)

(අ) ජනරජයේ ජනාධිපතිවරයා ;

(ආ) පාර්ලිමේන්තුවේ විපක්ෂනායකවරයා ;

(ඇ) ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරවරයා ;

(ඈ) විගණකාධිපතිවරයා ;

(ඉ) ස්වකීය ජීවිත කාලය තුළ දී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය සහ ඉන් පසුව, අභාවප්‍රාප්ත විජය කුමාරතුංග මහතාගේ ජීවත්ව සිටින වැඩිමහල්ම පැවතෙන්නා ;

2—D 047385—5,900 (98/03)

එසේ වුවද, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය, යම් කාලසීමාවක් තුළ මණ්ඩලයේ නිලබලයෙන් සාමාජිකාවක්ව සිටින්නී නම්, අභාවප්‍රාප්ත විජය කුමාරතුංග මහතාගේ ජීවත්ව සිටින වැඩිමහල්ම පැවතෙන්නා විසින් ඒ කාලසීමාව තුළ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස සේවය කරනු ලැබිය හැකි ය:

එසේම ජීවත්ව සිටින වැඩිමහල්ම පැවතෙන්නා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස සේවය කිරීමට අකමැති නම් හෝ එසේ සේවය කිරීමට වැඩිමහල්ම පැවතෙන්නාට නොහැකිනම් හෝ ජීවත්ව සිටින ඊළඟ වැඩිමහල්ම පැවතෙන්නා විසින් මණ්ඩලයේ සාමාජිකයකු ලෙස සේවය කරනු ලැබිය හැකි ය.

(ඊ) චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය විසින් ස්වකීය ජීවිත කාලය තුළ දී සහ ඉන් පසුව මණ්ඩලය විසින්, විදේශ කටයුතු, නීතිය, අධ්‍යාපනය හෝ කලා ශිල්ප පිළිබඳ පිළිගත් දක්ෂතාවක් හෝ විශිෂ්ටතාවක් අත්කර ගෙන ඇති අය අතුරින් පත් කරනු ලබන තැනැත්තන් දෙදෙනෙක්.

(2) (අ) (1) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ පත් කරනු ලබන සාමාජිකයකු විසින්, මණ්ඩලය අමතා තත් කාර්යය සඳහා යවන ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(ආ) (1) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ පත් කරනු ලබන සාමාජිකයකු, ඕනෑම අවස්ථාවක දී අවස්ථාවෝචිත පරිදි, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය විසින් හෝ මණ්ඩලය විසින් හෝ ඉවත් කරනු ලැබිය හැකි ය.

(ඇ) මේ උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල විධිවිධානවලට යටත්ව, (1) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ පත් කරනු ලබන සාමාජිකයකුගේ ධුර කාලය, ඔහුගේ පත් කිරීමේ දින සිට අවුරුදු තුනක් විය යුතු ය.

(ඇ) කාලය ඉකුත් වීමෙන් ධුරය හිස්කරන (1) උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයකු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) ඡේදවල සඳහන් සාමාජිකයකු මණ්ඩලයේ සාමාජිකයකු වී ඇත්තේ, යම් ධුරයක් දැරීම ප්‍රකාරව ද ඒ ධුරය දරන තාක් කල් ඔහු මණ්ඩලයේ සාමාජික ධුරය දැරිය යුතු ය.

(4) ජනාධිපතිවරයා මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට ජනාධිපතිවරයා පැමිණ නොමැති විට, ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් තමන් අතුරින් සභාපතිවරයකු, ඒ රැස්වීමේ සභාපතිවරයා වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(5) මණ්ඩල රැස්වීමක් සඳහා ගණපූරණය පස්දෙනෙක් විය යුතු ය.

(6) (5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, මණ්ඩලයේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය, මණ්ඩලය විසින් විධිමත් කරගනු ලැබිය හැකි ය.

(7) මණ්ඩලයේ සාමාජිකත්වයෙහි පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුවෙන්, මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක්, නිර්බල වන්නාක් සේ නොසැලකිය යුතු ය.

(8) මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කළ යුතු සියලු ප්‍රශ්න, පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සංඛ්‍යාව සමාන වන අවස්ථාවක, සභාපතිවරයාට හෝ මණ්ඩලයේ යම් රැස්වීමක මූලාසනය දරන වෙනත් යම් සාමාජිකයකුට, ඔහුගේ ඡන්දයට අමතරව, තීරක ඡන්දයක් තිබිය යුතු ය.

4. පදනමේ මුද්‍රාව— පදනමේ මුද්‍රාව.

(අ) මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි යම් තැනැත්තකු භාරයේ තිබිය යුතු ය ;

(ආ) මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය ;

(ඇ) මණ්ඩලයේ අනුමතය ඇතිව සහ තමන් පැමිණ සිටි බවට සළකුණක් වශයෙන් ලේඛනයට අත්සන් තැබිය යුතු, මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, කිසිම ලේඛනයකට නොතැබිය යුතු ය.

පදනමේ අරමුණු.

5. පදනමේ අරමුණු පහත දැක්වෙන පරිදි වන්නේ ය :—

(අ) ශ්‍රී ලංකාවේ පොදු මහජනතාව මෙන්ම සියලු ජන කොට්ඨාස අතර, සාමය, හොඳහිත, අවබෝධය සහ සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම ;

(ආ) ආර්ථික හා සාමාජික වශයෙන් අසතුටුදායක තත්වයක සිටින තරුණයන්ගේ තත්වය නගා සිටුවීම සඳහා කටයුතු කිරීම ;

(ඇ) අධ්‍යාපනය හා දැනුම වැඩිදියුණු කිරීම සහ ශිෂ්‍යයන්ට, පර්යේෂකයන්ට, සහ පිළිගත් ආයතනවලට හෝ සංවිධානවලට ශිෂ්‍යත්ව, ප්‍රදාන, හෝ වෙනත් ආකාරයේ මූල්‍යමය ආධාර සැපයීම ;

(ඈ) සංස්කෘතික, සාහිත්‍යමය සහ පුණ්‍යමය කටයුතු දිරිගැන්වීම හා ප්‍රවර්ධනය කිරීම ;

(ඉ) තරුණයන්ගේ දැනුම වැඩිදියුණු කිරීම හා ඔවුන්ට රැකියා ලබාගැනීමට හැකියාව ලබාදීමේ අරමුණ ඇතිව, ප්‍රසිද්ධ දේශන, සම්මන්ත්‍රණ, වැඩමුළු, සම්මේලන, විවාද, කෙටිකාලීන අධ්‍යාපනික පාඨමාලා සංවිධානය කිරීම සහ පැවැත්වීම ;

(ඊ) ජාතික හා අන්තර්ජාතික වැදගත්කමකින් යුතු කාරණා පිළිබඳ ප්‍රකාශන පළකිරීම, ප්‍රවර්ධනය කිරීම සහ දිරිගැන්වීම ;

(උ) අධ්‍යාපනික ආයතන, පුස්තකාල, කෞතුකාගාර සහ රෝහල් පිහිටුවීම සහ ඒවා පවත්වාගෙන යාම ;

(ඌ) ජාත්‍යන්තර සාමය, අවබෝධය සහ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම ;

(එ) ශ්‍රී ලංකාවේ සිනමාව සංවර්ධනය කිරීම සඳහා සෑම ආකාරයකම සහයෝගය ලබාදීම ;

(ඒ) ඉහත සඳහන් අරමුණු සියල්ලම හෝ ඉන් කිසිවක් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ක්‍රියා හෝ දේ කිරීම.

6. මේ පනතේ විධිවිධානවලට යටත්ව, පදනමට මෙහි පහත පදනමේ බලතල සඳහන් බලතල ඇත්තේ ය :—

(අ) මේ පනත යටතේ හෝ යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් හෝ අන්‍යාකාරයකින් පදනම වෙත සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීම හා දැරීම සහ ඒ දේපළ හා සම්බන්ධ යම් භාරයකට යටත්ව, ඒ දේපළ විකිණීම, උකස් කිරීම, බදු දීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම :

එසේ වුවද, පදනමේ කිසිම නිශ්චල දේපළක්, අමාත්‍යවරයාගේ පූර්ව අනුමතිය නොමැතිව නොවිකිණිය යුතු ය.

(ආ) පදනමෙහි අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට ඇතුළත් වී ඒවා ක්‍රියාත්මක කිරීම ;

(ඇ) දේශීය හෝ විදේශීය තැනැත්තන්ගෙන් හෝ සංවිධානවලින් මුදලින් හෝ ද්‍රව්‍යමය වශයෙන් ලැබෙන ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග ලබා ගැනීම හෝ එකතු කර ගැනීම ;

(ඈ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධනපත්‍ර පිළියෙල කිරීම, ලිවීම, භාර ගැනීම, පිටසන් කිරීම, ගනුදෙනු කිරීම, මිලට ගැනීම, විකිණීම සහ නිකුත් කිරීම සහ යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරි කිරීමේ හා තැන්පතු ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම ;

(ඉ) පදනමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි මුදල්, ඇප ඇතිව හෝ ඇප නොමැතිව ණයට ගැනීම ;

(ඊ) යොදවා නොමැති ආදායම් ඇතුළුව, පදනමට අයත් යම් මුදලක් (87 වන අධිකාරය වන) භාර ආඥා පනතේ 20 වන වගන්තිය යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ භාර අරමුදල් ආයෝජනය කිරීම නීත්‍යානුකූල වන සුරැකුම්පත්වල

ආයෝජනය කිරීම හෝ එවැනි යම් මුදල් ශ්‍රී ලංකාව තුළ නිශ්චල දේපළ මිල දී ගැනීම සඳහා ආයෝජනය කිරීම හෝ ඒ ආයෝජන වෙනස් කිරීම හෝ වහාම වියදම් කිරීමට අවශ්‍ය නොවන මුදල් හෝ ඒ මුදල්වල යම් ප්‍රමාණයක්, යම් බැංකුවක ස්ථිර තැන්පතු ලෙස යෙදවීම ;

(ඇ) පදනමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් නිලධරයන් හා සේවකයන් පත් කිරීම ; සහ

(ඈ) පදනමේ ක්‍රියාකාරිත්වය හා සම්බන්ධ සියලු කාරණා පිළිබඳව රීති සෑදීම.

පදනමේ නිලධරයන් හා සේවකයන්.

7. (1) මේ පනතේ විධිවිධානවලට සහ ඒ යටතේ සාදන ලද යම් රීතිවලට යටත්ව, පදනමේ නිලධරයන් හා සේවකයන් පත් කිරීමට, මණ්ඩලයට බලය ඇත්තේ ය.

(2) පදනමේ නිලධරයන් හා සේවකයන්ගේ සෑම පත් කිරීමක්ම, බඳවා ගැනීමේ පටිපාටිවලට අනුකූලව සහ රීති මගින් නියමිත බඳවා ගැනීමේ කාර්ය පටිපාටිවලට අනුකූලව, මණ්ඩලය විසින් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ විධිවිධානවලට සහ ඒ යටතේ සාදන ලද යම් රීතිවලට යටත්ව, පදනමේ නිලධරයන්ගේ වේතන, වැටුප් සහ වෙනත් පාරිශ්‍රමික ද ඇතුළුව, ඔවුන්ගේ සේවා නියමයන් හා කොන්දේසි, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(4) පදනමේ නිලධරයන් සහ සේවකයන් සේවයෙන් පහ කිරීමේ බලතල ඇතුළුව, පදනමේ නිලධරයන් සහ සේවකයන්, මණ්ඩලයේ විනය පාලනයට යටත් විය යුතු ය. විනය කාරණා සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(5) පදනමේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ ප්‍රතිලාභය පිණිස, මණ්ඩලය විසින් අර්ථ සාධක අරමුදල් හා යෝජනා ක්‍රම පිහිටුවනු ලැබිය හැකි අතර ඒ අරමුදල්වලට හා යෝජනා ක්‍රමවලට දායක මුදල් ගෙවනු ලැබිය හැකි ය.

*පදනම යටතේ සේවය, ගිවිසුම්වල කාර්ය සඳහා ආණ්ඩුවට කරන ලද සේවයන් සේ සැලකිය යුතු බව.*

8. යම් නිශ්චිත කාලසීමාවක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමඟ ගිවිසුමකට ඇතුළත් වී ඇති යම් තැනැත්තකු, පදනම විසින් සේවයේ නියුක්ත කරනු ලැබ ඇති අවස්ථාවක දී ඒ තැනැත්තා විසින් පදනමේ සේවය කරන යම් කාලසීමාවක්, එකී ගිවිසුම යටතේ ඔහුගේ ඒ බැඳීම ඉටු කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුව වෙත සේවය කරන සේවා කාලසීමාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

*රජයේ නිලධරයන් පදනමේ කාර්ය මණ්ඩලයට පත් කිරීම.*

9. (1) මණ්ඩලයේ ඉල්ලීම පිට, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට ගැනෙන යම් ආයතනයක හෝ දෙපාර්තමේන්තුවක සේවය කරන, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ ඒ නිලධරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් දෙන ලද කැමැත්ත ඇතිව, පදනමේ කාර්ය මණ්ඩලයට, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් කාලසීමාවකට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලයේ ඉල්ලීම පිට, මෙහි (1) වන උපවගන්තියේ සඳහන් රජයේ නිලධරයකු නොවන යම් රජයේ නිලධරයකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, පදනමේ කාර්ය මණ්ඩලයට, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි කාලසීමාවකට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(3) යම් රජයේ නිලධරයකු පදනමේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් රජයේ නිලධරයකු, පදනමේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) මණ්ඩලයේ ඉල්ලීම පිට, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ පිහිටුවන ලද යම් උසස් අධ්‍යාපන ආයතනයක නිලධරයකු හෝ සේවකයකු, ඒ නිලධරයාගේ හා සේවකයාගේ ද, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ද, අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ ද කැමැත්ත ඇතිව, පදනමේ කාර්ය මණ්ඩලයට, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි කාලසීමාවකට, තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය: නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(6) මේ වගන්තියෙහි, "උසස් අධ්‍යාපන ආයතනය" සහ "ප්‍රධාන විධායක නිලධාරී" යන යෙදුම් වල, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ ඒවාට දී ඇති අර්ථය ම ඇත්තේ ය: තවද "විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතින් පිහිටුවන ලද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ.

II වන කොටස

## මුදල්

පදනමේ අරමුදල.

10. (1) පදනමට (මෙහි මින් මතු අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන) අරමුදලක් තිබිය යුතු ය.

(2) පදනමේ අරමුදලට—

(අ) ස්වකීය බලතල කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී පදනමට ලැබෙන සියලු මුදල් ;

(ආ) ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත කවර හෝ ප්‍රභවයකින්, ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් පදනමට ලැබෙන සියලු මුදල් ; සහ

(ඇ) පදනමේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබිය හැකි සියලු මුදල්

බැර කරනු ලැබිය යුතු ය.

(3) පදනමේ අරමුදලින්—

(අ) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී පදනම විසින් දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය විය හැකි සියලු මුදල් ; සහ

(ආ) මේ පනත මගින් හෝ එය යටතේ අරමුදලින් ගෙවීමට නියමිත සියලු මුදල් ප්‍රමාණයන්

ගෙවනු ලැබිය යුතු ය.

11. (1) පදනමේ ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව, පදනම විසින් නිසි ගිණුම් පොත් තබාගැනීමට විධිවිධාන සැලැස්විය යුතු ය. නිසි ගිණුම්පොත් තබා ගැනීමට පදනම විසින් විධිවිධාන සලස්වනු ලැබිය යුතු බව.

(2) පදනමේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(3) පදනමේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව අදාළ විය යුතු ය.

12. (1) පදනම විසින් ආනයනය කරනු ලබන යම් භාණ්ඩ, පදනමේ අරමුණු ඉදිරියට ගෙනයාම සඳහා හිතකර බව සැලකේ නම්, අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, එම භාණ්ඩ ආනයනය වෙනුවෙන් කිසි රේගු බද්දක් ගෙවීමෙන්, පදනම නිදහස් කරනු ලැබිය හැකි ය. අමාත්‍යවරයා විසින් පදනම ආදායම් බදු ගෙවීමෙන් නිදහස් කළ යුතු බව.

(2) පදනම 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ ආදායම් බදු ගෙවීමෙන් නිදහස් වන්නේ ය.

(3) යම් තැනැත්තකු විසින්, මුදලින් හෝ අන්‍යාකාරයෙන් පදනම වෙත කරන පරිත්‍යාගයක්, ආණ්ඩුව විසින් පිහිටුවන ලද අරමුදලකට මුදලින් හෝ අන්‍යාකාරයෙන් කරන පරිත්‍යාගයක් ලෙස, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 32 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ කාර්යය සඳහා, සලකනු ලැබිය යුතු ය.

## III වන කොටස

## පොදු විධිවිධාන

13. පදනමේ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන්, අමාත්‍යවරයා විසින් කලින් කල පොදු හෝ විශේෂ විධාන, මණ්ඩලය වෙත ලියවිල්ලක් මගින් දෙනු ලැබිය හැකි ය. මණ්ඩලය සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ බලතල.

චංචල සහ නිශ්චල රජයේ දේපළ පදනමට ලබා දිය යුතු බව.

14. (1) පදනමේ කාර්ය සඳහා අවශ්‍ය වන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයට අයත් යම් චංචල හෝ නිශ්චල දේපළක්, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, පදනම වෙත පවරා දෙනු ලැබිය හැකි අතර, එසේ පවරා දෙනු ලැබූ යම් දේපළක්, ඒ නියමයේ දින සිට, පදනම වෙත පැවරෙන අතර එය පදනමේ දේපළක් බවට පත් වන්නේ ය.

(2) අමාත්‍යවරයා විසින්, කත් කාලයෙහි රජයේ ඉඩම් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නිශ්චය කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව, යම් රජයේ ඉඩමක් පදනමේ යම් කාර්යයක් සඳහා පදනමේ ප්‍රයෝජනය පිණිස ලබා දීම හෝ පදනම වෙත පවරා දීම හෝ කරනු ලැබිය හැකි ය.

(3) රජයට අයත් යම් චංචල දේපළක් පදනමේ කාර්ය සඳහා අවශ්‍ය වන අවස්ථාවක, එම චංචල දේපළෙහි සන්තකය සහ ප්‍රයෝජනය අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළකරන නියමයක් මගින්, පදනම වෙත පවරා දීම සහ පදනම සතු කර දීම කරනු ලැබිය හැකි ය :

එසේ වුවද රජයේ යම් චංචල දේපළක් කෙරෙහි බලපවත්වන කිසි නියමයක්, ඒ දේපළ පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව, මේ උපවගන්තියේ මීට පූර්ව විධිවිධාන යටතේ අමාත්‍යවරයා විසින් කරනු නොලැබිය යුතු ය.

මණ්ඩලයේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බව.

15. එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු මාස හයක කාලසීමාවක් ඇතුළත, ඒ වර්ෂය තුළ පදනමේ කටයුතුවල සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කරන වාර්තාවක්, මණ්ඩලය විසින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඒ වාර්තාව අදාළ වන වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේ අවසානයට පෙර, අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබීමට කටයුතු සැලැස්විය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව පදනම උපලේඛනගත ආයතනයක් විය යුතු බව.

16. අල්ලස් පනතේ අර්ථානුකූලව, පදනම උපලේඛනගත ආයතනයක් විය යුතු අතර, ඒ පනතේ විධිවිධාන එපරිද්දෙන් අර්ථකථනය කරනු ලැබිය යුතු ය.

17. මණ්ඩලයේ සියලු සාමාජිකයන් සහ පදනමේ සියලු නිලධරයන් හා සේවකයන්, දණ්ඩනීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන් සහ පදනමේ නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

18. (1) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත, මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් හෝ පදනමේ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් හෝ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් කිසිම සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් හෝ පවරනු නොලැබිය යුතු ය.

මෙම පනත යටතේ කරන ක්‍රියාවක් සම්බන්ධයෙන් නඩු පැවරිය නොහැකි බව.

(2) යම් අධිකරණයක් ඉදිරියේ, පදනම විසින් හෝ පදනමට එරෙහිව පවරා ඇති යම් සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී පදනම විසින් දරන ලද යම් වියදමක්, පදනමේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී පදනම වෙත කරනු ලැබූ හෝ පදනම විසින් අයකර ගනු ලැබූ යම් ගාස්තු, පදනමේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් කර ඇති පරිදි එවැනි යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, ඔහුට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරා ඇති යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද ක්‍රියාවක් බවට අධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත්, ඒ වියදම ඔහු විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අයකර ගන්නා ලද්දේ නම් මිස, පදනමේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

19. මේ පනතේ විධිවිධානවලට යටත්ව, පහත දැක්වෙන රීති. කරුණු සියල්ලම හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන්, මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය :

(අ) පදනමේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ පාරිශ්‍රමික ද ඇතුළුව, ඒ නිලධරයන්ගේ හා සේවකයන්ගේ සේවා නියමයන් හා කොන්දේසි ;

(ආ) පදනමේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ බඳවාගැනීමේ පටිපාටි සහ පත් කිරීම පිළිබඳ කාර්ය පටිපාටි ;

(ඇ) පදනමේ වාර්ෂික වැඩ සටහන සහ වැඩ සැලැස්ම, වාර්ෂික අයවැය ලේඛනය, වාර්ෂික වාර්තාව හා ගිණුම් සහ ඒ වැඩ සටහන හා සැලැස්ම, අයවැය ලේඛනය, වාර්තාව හා ගිණුම් පිළියෙල කළ යුතු ආකාරය ;

(ඈ) රීති සෑදීමට මේ පනතින් නියම කර ඇත්තේ හෝ බලය දී ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද එවැනි වෙනත් යම් කාරණා.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**20.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**21.** පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි 'අමාත්‍යවරයා' යන යෙදුමෙන් සංස්කෘතික කටයුතු විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.